සාමාන්‍ය සමය විසිඅටවන ඉරුදින **දේව ප්‍රකාශන** 14-10-12

## පළමුවන කියැවීම

සලමොන්ගේ ප්‍රඥ 7:7-11

සලමොන්ගේ ප්‍රඥාව නමැති පොතෙන් ගත් පාඨයෙකි.

**"ප්‍රඥාව සමග සැසඳූන විට ධන සම්පත මම කිසිසේත් නොතැකීමි."**

මම යාච්ඤා කළෙමි. මට දැනුම් පැහැදුම් දෙන ලදී. මම අයැදුම් කළෙමි. මට ප්‍රඥාව ලැබුණේ ය. රාජ කොන්තයට හා සිහසුනට වඩා මම ප්‍රඥාව අගය කළෙමි. ඇය සමග සැසඳූන විට ධන සම්පත මම කිසිසේත් නොතැකීමි. ඇයට සමාන වටිනා මැණිකක් නොමැත. ඇය සමග සැසැඳූ විට රත්රන් සියල්ල වැලි මිටක් පමණ ය. ශරීර සනීපයට හා රූමත් බවට වැඩියෙන් මම ඇයට ප්‍රේම කළෙමි. ආලෝකයට වඩා මම ඇයට කැමති වූයෙමි. මන්ද, ඇගේ දීප්තිය නිති නොමැළවී පවතියි. ඇය සමග මට යහපත් සියල්ල ලැබිනි. ඇය මගින් අසංඛ්‍ය වස්තු මට හිමිවුණි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 90:12-17

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ ප්‍රේමයෙන් අප පිරෙව්ව මැනව.

ගීය: දිවි පෙවෙත කොතරම් ලුහුඬු ද කියා වටහා දුන මැනව. මෙය මෙනෙහි කරන පිණිස නැනවත් සිතක් අපට දුන මැනව. සමිඳුනි, මෙතරම් දිගු කලක් ඈත් වී නොසිට ඔබ අප වෙත පෙරළා පැමිණිය මැනව. ඔබේ දාසයන්ට අනුකම්පා කළ මැනව.

උදයෙන් උදය ඔබේ ප්‍රේමයෙන් පිරී අවදි වමු. දවස පුරා තුටු පහටු සිතින් ගී ගයමු. අප පීඩා වින්ද සමය පමණට ද අප නපුරට ලක්වූ කාලය තරමට ද අපට සොම්නස් සමයක් දුන මැනව.

ඔබේ ප්‍රබල ක්‍රියා ඔබේ මෙහෙකරු අපට ද ඔබේ තේජස අප පරපුරට ද දක්නට වරම් දුන මැනව. අප දෙවිඳුන්ගේ කරුණාව අප කෙරෙහි බැබළේවා! අපේ වැඩ කටයුතු ඔබ මගින් ජයෙන් ජයට පැමිණේවා! අපේ වැඩ කටයුතු ඔබ මගින් ජයෙන් ජයට ම පැමිණේවා!

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 4:12-13

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"දේව වචනය සිතේ සිතුවිලි ද අරමුණු ද විමසන්නේ ය."**

දෙවියන් වහන්සේගේ වචනය ජීවමාන ය. ක්‍රියාශීලී ය. දෙමුවහත් කඩුවකටත් වඩා තියුණු ය. ආත්මය ප්‍රාණ වායුවෙන් ද සන්දි ඇට මිදුළුවලින් ද වෙන් කරන තරම් විනිවිද යන්නේ ය. සිතේ සිතුවිලි ද අරමුණු ද විමසන්නේ ය. උන් වහන්සේ කෙරෙන් සැඟවිය හැකි කිසිවක් මුළු විශ්වයේ ම නැත. උන් වහන්සේගේ ඇස් ඉදිරියෙහි සියල්ල වැස්මක් නැතිව විවෘත ව තිබේ. අප ගනන් දිය යුත්තේ උන් වහන්සේට ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** මතෙව් 11:25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත්, පොළොවටත්, ස්වාමින් වන පියාණන් වහන්ස, දේව රාජ්‍යය පිළිබඳ අභිරහස් හුදෙක් බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබ වහන්සේට තුති වේවා!
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 10:17-30

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දන් දෙන්න. එන්න මා අනුගාමී වන්න."**

ජේසුස් වහන්සේ මඟ බැස ගමන් ගනිත් ම එක් මිනිසෙක් දිව අවුත් ඔවුන් වහන්සේ ඉදිරියෙහි දණින් වැටී, "යහපත් ගුරුදේවයෙනි, සදාතන ජීවනය උරුම කරගන්නා පිණිස මා කුමක් කළ යුතු දැ"යි උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ ඔහුට කතා කොට, "මා යහපත් යයි ඔබ කියන්නේ මන් ද? හුදෙක් දෙවියන් වහන්සේ මිස අන් කිසිවෙක් යහපත් නොවේ. ඔබ ආඥා දන්නෙහි ය. මිනී නොමරන්න; කාමමිථ්‍යාචාරය නොකරන්න; සොරකම් නොකරන්න; බොරු සාක්ෂි නොකියන්න; වංචා නොකරන්න; නුඹේ පියාටත්, මවටත් ගෞරව කරන්න යනු"යි වදාළ සේක. ඔහු ද උත්තර දෙමින්, "ගුරුදේවයෙනි, මම මේ සියල්ලක් ම යොවුන් වියේ සිට රක්ෂා කෙළෙමි"යි උන් වහන්සේට කීවේ ය. ජේසුස් වහන්සේ ඔහු දෙස බලා, ඔහු කෙරෙහි මෙත් සිත් වඩා, "ඔබට එක අඩු පාඩුවක් ඇත; යන්න, ඔබ සතු සියල්ල විකුණන්න; විකුණා දිළිඳුන්ට දන් දෙන්න; ස්වර්ගයෙහි ඔබට සම්පත් ඇති වන්නේ ය. එන්න මා අනුගාමී වන්නැ"යි ඔහුට වදාළ සේක. එහෙත් ඔහු ඒ කීම නිසා මලානික වී, දොම්නසින් පිරී එතැනින් නික්ම ගියේ ය. එසේ කෙළේ, ඔහුට වස්තු සම්භාරයක් තිබුණු බැවිනි. එවිට ජේසුස් වහන්සේ අවට බලා, "ධනවතුන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීම කොතරම් දුෂ්කර දැ"යි ශ්‍රාවකයන්ට වදාළ සේක. ශ්‍රාවකයෝ ද ඒ අසා විස්මයට පත්වූ හ. ජේසුස් වහන්සේ නැවතත් මෙසේ වදාළ සේක; "දරුවෙනි, දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීම කොතරම් දුෂ්කර ද? ධනවතෙකුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීමට වඩා ඔටුවෙකුට ඉඳිකටු මලින් රිංගා යාම පහසු ය." ඔව්හු අතිශයින් මවිත වී, "එසේ නම් ගැළවීම ලැබිය හැක්කේ කවරෙකුට දැ"යි ඔවුනොවුන් අතර කියාගත්හ. ජේසුස් වහන්සේ ඔවුන් දෙස බලා, "මිනිසුන්ට නම් එය කළ නොහැකි ය. දෙවියන් වහන්සේට එසේ නොවේ දෙවියන් වහන්සේට සියල්ල කළ හැකි ය"යි වදාළ සේක. පේදුරු කතා කරමින්, "බලන්න, අපි සියල්ලම අත්හැර දමා ඔබ අනුව ආවෙමු"යි කී ය. ජේසුස් වහන්සේ ද, "සැබැවින් ම මම ඔබට කියමි; මා නිසා ද සුබ අස්න නිසා ද, ගේදොර හෝ සොහොයුරන් හෝ සොහොයුරියන් හෝ මව හෝ පියා හෝ දරුවන් හෝ ගම්බිම් හෝ අත්හළ කවරෙකු වුව ද, ඔහු දැන් මේ කාලයේ දී ම සිය ගුණයක් ගේදොර ද සොහොයුරන් ද සොහොයුරියන් ද මවුවරුන් ද දරුවන් ද ගම්බිම් ද ඒ සමඟ පීඩා ද, එන යුගයේ දී සදාතන ජීවනය ද නොලබා නොසිටින්නෝ ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.